# 27. චූලහත්ථිපදොපම සූත්‍රය

**1.**මා විසින් මෙසේ අසන ලදි. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඩු සිටුහු විසින් කරවන ලද ජේතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති. එකල්හු ජානුස්සොනි නම් බ්‍රාහ්මණ තෙම සුදු වෙළඹුන් යෙදූ සියල්ල සුදුවූ රථයකින් මධ්‍යාහ්නයෙහි (මැදි දවල් ) සැවත් නුවර වීථින්හි ගමන් කරයි.

ජානුස්සොනි බ්‍රාහ්මණ තෙම එන්නාවූ පිලොතික නම් පරිබ්‍රාජකයා දුරදීම දුටුවේය: දැක පිලොතික පරිබ්‍රාජකයාට මෙසේ කීයේය. ,පින්වත, *වච්ඡායන[1]තෙමේ මේ මැදි දවල් කොහි සිට එන්නෙහිද, ?

පින්වත, මම ශ්‍රමණ භවත් ගෞතමයන් සමීපයෙහි සිට එමි,යි (කීය)

පින්වත්, වච්ඡායන තෙම ඒ ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ දක්‍ෂකමගැන නුවණ ඇති බව ගැන ඔබ කුමක් සිතන්නෙහිද? පණ්ඩිතයෙකැයි සිතන්නෙහිද? යි (ඇසීය )

පින්වත මම කවරෙක්ද? ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රඥාවෙහි දක්‍ෂ බව දැන ගැනීමට තරම් මම කවරෙක්ද? යමෙක් ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රඥාවෙහි දක්‍ෂ බව දැන ගන්නේ නම් ඔහුත් උන්වහන්සේ හා සමාන කෙනෙකු විය යුතුය.,

පින්වත් වච්ඡායන තෙම ඉතා උසස් ප්‍රශංසාවෙන්ම ශ්‍රමණ ගෞතමයන්ට ප්‍රශංසා කෙරේ,යි.

පින්වත, මම කවරෙක්ද? කවරෙක්වූ මම ශ්‍රමණ ගෞතමයන්ට ප්‍රශංසා කරන්නෙම්ද? 'ඒ පින්වත් ශ්‍රමණ ගෞතම තෙම ප්‍රශංසා කළ යුත්තන් (උසස් අය) විසින් දෙව් මිනිසුන්ට ශ්‍රෙෂ්ඨයයි ප්‍රශංසා කරන ලදි.,

පින්වත් වච්ඡායන තෙම කුමන කාරණයක් දකිමින් ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මෙසේ පැහැදුනේද,?

**2.**,පින්වත, යම්සේ ඇතුන් වසන වනයකට ඇතුළුවන දක්‍ෂපුද්ගලයෙක් ඇතුන් වසන වනයට ඇතුල් වේද, ඔහු ඇතුන් වසන වනයෙහි දිගින්ද දික්වූ පුළුලින්ද පුළුල්වූ මහත්වූ ඇත්පියවරක් (අඩි සටහනක්) දකින්නේද, පින්වත, ඒ මහා ඇතෙක්යයි ඔහු තීරණයට පැමිණෙයි. පින්වත, එපරිද්දෙන් මමද යම් තැනක පටන් ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි ඥාණපද සතරක් (නුවණ පියවර) දුටුයෙම්ද, එතැන් පටන් භාග්‍යවතුන් වහන්සේ දතයුතු සියල්ල තමන්ම, ස්වඥාණයෙන්

[1] *වච්ඡායන බිම් ගොත්‍ර (Cast) ඇති හෙයින් එසේ කීය.

අවබොධ කළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ධර්‍මය ස්වාක්ඛාතය මැනවින් දේශනා කරනලදි, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසංඝයා සුපටිපන්නය (යහපත්ව පිළිපන්නේය) කියා තීරණයට පැමිණියෙමි.

කවර සදාණපද සතරක්ද යත්, පින්වත, මේ ලොකයෙහි සියුම් බුද්ධි ඇති, අනුන් හා වාද කිරීමෙහි පුරුද්ද ඇති, වාල වෙධීන් (විදුලි එළියෙන් අස් ලොමට විදිමට සමතුන්) වැනිවූ ප්‍රඥා බලයෙන් අන්‍ය දෘෂ්ටීන් බිඳිමින් හැසිරෙත්යයි සලකන යම් ක්‍ෂත්‍රිය පණ්ඩිතයෙක් දක්නෙම්ද, ඔවුහු ශ්‍රමණ භවත් ගෞතමයන් අසුවල් නම් ගමට හෝ නියම් ගමට හෝ පැමිණෙතියි අසත්ද, අපි ශ්‍රමණ ගෞතමයන් කරා ගොස් මේ ප්‍රශ්න අසන්නෙමුයි ඔවුහු ප්‍රශ්න සූදානම් කරත්. ‘ඉදින් අප විසින් අසන ලද්දේ මෙසේ උත්තර කියන්නාහ. එවිට අපි මෙසේ වාදාරොපනය කරමු. ඉදින් අප විසින් මෙසේත් අසන ලද්දේ මෙසේ උත්තර දෙන්නේය. එවිට අපි මෙසේත් වාදය නගමු’යි (කියායි) අසුවල් නම් ගමට හෝ නියම් ගමට හෝ ශ්‍රමණ ගෞතමයින් පැමිණියහයි අසා ඔවුහු ශ්‍රමණ ගෞතමයන් යම් තැනකද එතැනට පැමිණෙත්. ශ්‍රමණ ගෞතමයෝ ධර්‍මානුකූල කථාවෙන් කරුණු දක්වා ඔවුන් එහි සමාදන් කරවත්, උත්සාහ කරවත්, සතුටු කරවත්. ඔවුහු ශ්‍රමණ ගෞතමයන් විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද්දාහු සමාදන් කරවන ලද්දාහු, උත්සාහ කරන ලද්දාහු, සතුටු කරවන ලද්දාහු, ශ්‍රමණ ගෞතමයින් ගෙන් ප්‍රශ්නවත් නොඅසති, උන් වහන්සේට කොයින් වාදාරොපනයක් කරද්ද (වාදය පිණිස කථා නොකරති) ඔවුහු එකාන්තයෙන් ශ්‍රමණ ගෞතමයන්ගේම ශ්‍රාවකයෝ වෙත්. පින්වත, යම් කලක ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මේ පළමුවන සදාණපදය දුටුවෙම්ද, එතැන් සිට ‘භාග්‍යවතුන් වහන්සේ දතයුතු සියල්ල තමන්ම අවබොධ කළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්‍මය හොඳින් දේශනා කරනලදි. භාග්‍යවතුන් වහන්සෙගේ ශ්‍රාවක සංඝයා සුපටිපන්නය යහපත්ව පිළිපන්නේය කියා තීරණයට පැමිණියෙමි.

**3.**,නැවතද පින්වත, මේ ලොකයෙහි සියුම් බුද්ධි ඇති, අනුන් හා වාද කිරීමේ පුරුද්ද ඇති වාල වෙධීන් වැනිවූ ප්‍රඥා බලයෙන් අන්‍ය දෘෂ්ටීන් බිඳිමින් හැසිරෙත් යයි සලකන යම් බ්‍රාහ්මණ පණ්ඩිතයන් මම දකිම්ද, ඔවුහු ශ්‍රමණ භවත් ගෞතමයන් අසුවල් නම් ගමට හෝ නියම් ගමට හෝ පැමිණෙතියි අසත්ද ‘අපි ශ්‍රමණ ගෞතමයින් කරා ගොස් මෙසේ අසන්නෙමු’යි ඔවුහු ප්‍රශ්න සූදානම් කරත්. ‘ඉදින් අප විසින් අසනලද්දේ මෙසේ උත්තර කියන්නාහ. එවිට අපි මෙසේ උන්වහන්සේට වාදාරොපනය කරමු. ඉදින් අප විසින් මෙසේත් අසන ලද්දේ මෙසේ උත්තර කියන්නාහ. එවිට අපි මෙසේත් වාදය නගමු’යි (කියාය). ඔවුහු අසවල් ගමට හෝ නියම් ගමට හෝ ශ්‍රමණ ගෞතමයන් පැමිණියහයි (අසා) ශ්‍රමණ ගෞතමයින් යම් තැනකද එතැනට පැමිණෙත්. (එසේ පැමිණි කල්හී) ශ්‍රමණ ගෞතමයෝ ධර්‍මානුකූල කථාවෙන් කරුණු දක්වා ඔවුන් එහි සමාදන් කරවත්. උත්සාහ කරවත්. සතුටු කරවත්. ඔවුහු ශ්‍රමණ ගෞතමයින් විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද්දාහු, උත්සාහ කරවන ලද්දාහු, සතුටු කරවන ලද්දාහු, ශ්‍රමණ ගෞතමයින්ගෙන් ප්‍රශ්නවත් නොඅසති. උන්වහන්සේට කොයින් වාදාරොපනය කරද්ද ? ඔවුහු එකාන්තයෙන් ශ්‍රමණ ගෞතමයන්ගේම ශ්‍රාවකයෝ වෙත්.

පින්වත, යම් කලක ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මේ දෙවෙනි ඥාණපදය දුටුයෙම්ද එතැන් සිට භාග්‍යවතුන් වහන්සේ සියල්ල තමන්ම අවබොධ කළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් හොඳින් ධර්මය දෙශනා කරනලදි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා යහපත්ව පිළිපන්නේය කියා තීරණයට පැමිණියෙමි.

4.,නැවතද පින්වත, මේ ලොකයෙහි සියුම් බුද්ධි ඇති, අනුන් හා වාද කිරීමෙහි පුරුද්ද ඇති, වාල වෙධීන් වැනිවූ ප්‍රඥා බලයෙන් අන්‍ය දෘෂ්ටීන් බිඳිමින් හැසිරෙත් යයි සලකන යම් ගෘහපති පණ්ඩිතයන් මම දකිම්ද, ඔවුහු ශ්‍රමණභවත් ගෞතමයන් අසවල් ගමට හෝ නියම් ගමට හෝ පැමිණෙත්යයි අසද්ද ‘අපි ශ්‍රමණ ගෞතමයින් කරා ගොස් මේ ප්‍රශ්න අසමුයි ඔවුහු ප්‍රශ්න සූදානම් කරති. ඉදින් අප විසින් අසන ලද්දේ මෙසේ උත්තර කියන්නාහ. ඔව්ට අපි මෙසේ උන්වහන්සේට වාදාරොපනය කරමු. ඉදින් අප විසින් මෙසේත් අසන ලද්දේ මෙසේ උත්තර කියන්නාහ. එව්ට අපි මෙසේත් වාදය නගමු’යි (කියාය). ඔවුහු අසවල් ගමට හෝ නියම් ගමට හෝ ශ්‍රමණ ගෞතමයන් පැමිණියහයි (අසා) ශ්‍රමණ ගෞතමයින් යම් තැනකද එතැනට පැමිණෙත්. (එසේ පැමිණි කල්හි) ශ්‍රමණ ගෞතමයෝ ධර්මානුකූල කථාවෙන් කරුණු දක්වා ඔවුන් එහි සමාදන් කරවත්. උත්සාහ කරවත්. සතුටු කරවත්. ඔවුහු ශ්‍රමණ ගෞතමයින් විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද්දාහු, උත්සාහ කරවන ලද්දාහු, සතුටු කරවන ලද්දාහු, ශ්‍රමණ ගෞතමයින්ගෙන් ප්‍රශ්නවත් නොඅසති. උන්වහන්සේට කොයින් වාදාරොපනය කරද්ද ? ඔවුහු එකාන්තයෙන් ශ්‍රමණ ගෞතමයන්ගේම ශ්‍රාවකයෝ වෙත්.

පින්වත, යම් කලක ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මේ තුන්වන ඥාණපදය දුටුවෙම්ද, එතැන් සිට ‘භාග්‍යවතුන් වහන්සේ දතයුතු සියල්ල තමන්ම අවබොධ කළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය හොඳින් දේශනා කරනලදි. භාග්‍යවතුන් වහන්සෙගේ ශ්‍රාවක සංඝයා සුපටිපන්නය යහපත්ව පිළිපන්නේය කියා තීරණයට පැමිණියෙමි.

5 පින්වත, මේ ලොකයෙහි සියුම් බුද්ධි ඇති, අනුන් හා වාද කිරීමෙහි පුරුද්ද ඇති, වාල වෙධීන් (විදුලි එළියෙන් අස් ලොමට විදීමට සමතුන්) වැනිවූ ප්‍රඥා බලයෙන් අන්‍ය දෘෂ්ටීන් බිඳිමින් හැසිරෙත්යයි සලකන යම් ක්‍ෂත්‍රිය පණ්ඩිතයෙක් දක්නෙමද, ඔවුහු ශ්‍රමණ භවත් ගෞතමයන් අසුවල් නම් ගමට හෝ නියම් ගමට හෝ පැමිණෙතියි අසත්ද, අපි ශ්‍රමණ ගෞතමයන් කරා ගොස් මේ ප්‍රශ්න අසන්නෙමුයි ඔවුහු ප්‍රශ්න සූදානම් කරත්. ‘ඉදින් අප විසින් අසන ලද්දේ මෙසේ උත්තර කියන්නාහ. එව්ට අපි මෙසේ වාදාරොපනය කරමු. ඉදින් අප විසින් මෙසේත් අසන ලද්දේ මෙසේ උත්තර දෙන්නේය. එව්ට අපි මෙසේත් වාදය නගමු’යි (කියායි) අසුවල් නම් ගමට හෝ නියම් ගමට හෝ ශ්‍රමණ ගෞතමයින් පැමිණියහයි අසා ඔවුහු ශ්‍රමණ ගෞතමයන් යම් තැනකද එතැනට පැමිණෙත්. ශ්‍රමණ ගෞතමයෝ ධර්මානුකූල කථාවෙන් කරුණු දක්වා ඔවුන් එහි සමාදන් කරවත්, උත්සාහ කරවත්, සතුටු කරවත්. ඔවුහු ශ්‍රමණ ගෞතමයන් විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද්දාහු සමාදන් කරවන ලද්දාහු, උත්සාහ කරන ලද්දාහු, සතුටු කරවන ලද්දාහු, ශ්‍රමණ ගෞතමයින් ගෙන් ප්‍රශ්නවත් නොඅසති, උන් වහන්සේට කොයින් වාදාරොපනයක් කරද්ද (වාදය පිණිස කථා නොකරති) ඔවුහු ගෞතමයන්ගේ සාසනයේ ප්‍රවජ්‍යාව ඉල්ලා සිටිත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේගෙන් පැවිද්ද උපසම්පදාව ලබන එම

සඞඝයා හුදෙකලාවෙත් අප්‍රමාදී වෙත් සතිය වඩත් කෙලෙස් තවන විරියෙන් යුක්තවෙත් නිර්වාන ධර්මයම අරමුනුකරන්නෝ වෙත් කිසියම් කුලපුත්‍රයෙක් යම්කිසි අරමුනක් සාක්ෂාකරගැන්මට ගෘහස්ත දිවිය හැරපියා සාසනයට ඇතුල්ව බඹසරැක්කේවේද එම අරමුන මෙම ජීවිතයෙහිදීම සාක්ෂාකරගන්නෝය මෙම ජීවිතයෙහිදීම එම උතුම් අරහත් සැප වළඳත් පවිත්‍රත්වය ලබන එම ආර්ය පුත්‍රයෝ මෙසේ කියන්නාහු වෙති.

"අහෝ නොඅනුමානවම අප පත්වන්නට තිබූ මහා ව්‍යාසනයෙන් ගැලවුනෝ නොවෙම්ද කලින් ශ්‍රමණයන් නොවීම අප ශ්‍රමණයන් ලෙස හැසිරුනෝ වම්හ බ්‍රාහ්මණයන් නොවීම අප බ්‍රාහ්මණයන් ලෙස හැසිරුනෝ වම්හ රහතුන් නොවීම අප රහතුන් ලෙස හැසිරුනෝ වම්හ තථාගතයන් වහන්සේගේ ආධාරයෙන් අද අප ශ්‍රමණයන් වම්හ බ්‍රාහ්මණයන් වම්හ රහතුන් වම්හ"

**6** පින්වත, යම් කලක ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි මේ සිව්වන පදාණපදය දුටුයෙම්ද එතැන් සිට භාග්‍යවතුන් වහන්සේ දතයුතු සියල්ල තමන්ම අවබොධ කළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් හොඳින් ධර්මය දේශනා කරන ලද්දහ. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා යහපත්ව පිළිපන්නේය කියා තීරණයට පැමිණියෙමි.

පිලෝතික පරිබ්‍රාජකයාගේ කථාව අසාවුන් ජානුස්සෝණි බ්‍රාහ්මණයා ඉක්බිති සුදු වෙළඹුන් යෙදූ සිය අශ්ව රථයෙන් බැස සිය සාටකය එක් උරයක් වැසෙන ලෙස සකස් කොටගෙන භාග්‍යවතුන් වහන්සේ වැඩසිටිනා දිසාවට හැරී මුහුණ ලා එදිසාවට දොහොත් මුදුන් දී වැඳ තෙවරක් මෙසේ වන්දනා කලෝය .
ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදු රජුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා
ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදු රජුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා
ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදු රජුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා
යම් දිනෙක ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදු රජුන් වහන්සේ දකින්නට කථාකරන්නට මටත් ලැබේවායි කීහ'

**7** ජානුස්සොනි බ්‍රාහ්මණ තෙම එසේ කියා ඉන් නොනැවතී භාග්‍යවතුන් වහන්සේ සොයා භාග්‍යවතුන් වහන්සේ සිටිනා තැනක්වේද එතැනට ගොස් භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පැත්තක හුන්නේය. එකත්පස්ව හිඳ පිලෝතික පරිබ්‍රාජකයා සමග තමන්ගේ වූ සංවාදය සම්පූර්ණයෙන්ම භාග්‍යවතුන් වහන්සේට කියා සිටියේය

එවිට භාග්‍යවතුන් වහන්සේ ජානුස්සෝණි බ්‍රාහ්මණයාට මෙසේ වදාළ සේක.

" පින්වත් බ්‍රාහ්මණය, ඔතෙකින් ඇත් පියවර සටහනේ උපමාව සම්පර්ණ වූවා නොවේ , ඇත් පියවර සටහනේ උපමාව ගැන විස්තර වශයෙන් මෙසේ කියන්නෙමි, මනාව සවන් යොමව නුවනින් මෙනෙහි කරව"

"එසේය, සවාමීනි", යි ජාණුස්සෝණි බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

8 “පින්වත් බ්‍රාහ්මනය, යම්සේ ඇතුන් වසන වනයකට ඇතුළුවන දක්‍ෂපුද්ගලයෙක් ඇතුන් වසන වනයට ඇතුල් වේද, ඔහු ඇතුන් වසන වනයෙහි දිගින්ද දික්වූ පුළුලින්ද පුළුල්වූ මහත්වූ ඇත්පියවරක් (අඩි සටහනක්) දකින්නේද, පින්වත් බ්‍රාහ්මනය, ඒ මහා ඇතෙක්යයි ඔහු එකනෙහිම තීරණයට නොපැමිණෙයි.

ඒ මක්නිසාදයත් පින්වත් බ්‍රාහ්මනය, මහ වනය ගැන දන්නා එම දක්‍ෂපුද්ගලයා මෙසේ දන්නේ වේ “මහ වණයෙහි වාමණිකා නම්වූ කුඩා කුරු ශරීරයක් සහිතමුත්, විශාල පිය සටහන් ඇති ඇතින්නියන් වෙසෙසක් වසන්නා වෙත්, මේ විශාල පිය සටහන එම වාමණිකා කුරු ඇතින්නියකගේ විය හැක,

මෙසේ සිතා ඔහු තවත් පරීක්‍ෂාකරන්නේ, දිගින්ද දික්වූ පුළුලින්ද පුළුල්වූ මහත්වූ ඇත්පියවරක් සමගම, උසැති වෘක්‍ෂයන්හි කඳේ උසින් සීරීම් ලකුනුද දකියි, එතෙකින් වුවද දිගින්ද දික්වූ පුළුලින්ද පුළුල්වූ මහත්වූ ඇත්පියවර මහා ඇතෙක්ගේ යැයි ඔහු තීරණයට නොපැමිණෙයි. ඒ මක්නිසාදයත් පින්වත් බ්‍රාහ්මනය, මහ වනය ගැන දන්නා එම දක්‍ෂපුද්ගලයා මෙසේ දන්නේ වේ , “මහ වණයෙහි උස්වූ ශරීරයක් සහිත විශාල පිය සටහන් ඇති උච්චා කාළාරිකා නම්වූ ඇතින්නියන් වෙසෙසක් වසන්නා වෙත්, මේ විශාල පිය සටහන එම උච්චා කාළාරිකා ඇතින්නියකගේ විය හැක,

මෙසේ සිතා ඔහු තවත් පරීක්‍ෂාකරන්නේ, දිගින්ද දික්වූ පුළුලින්ද පුළුල්වූ මහත්වූ ඇත්පියවරක් සමගම, උසැති වෘක්‍ෂයන්හි කඳේ උසින් සීරීම් ලකුනුද දකියි, ඇත් දළෙන් ඇන වෘක්‍ෂයන්හි කඳේ ඉතා ඇතිවුනු සටහන් ද දකියි , එතෙකින් වුවද එම දිගින්ද දික්වූ පුළුලින්ද පුළුල්වූ මහත්වූ ඇත්පියවර මහා ඇතෙක්ගේ යැයි ඔහු තීරණයකට නොපැමිණෙයි. —

ඒ මක්නිසාදයත් පින්වත් බ්‍රාහ්මනය, මහ වනය ගැන දන්නා එම දක්‍ෂපුද්ගලයා මෙසේ දන්නේ වේ “මහ වණයෙහි ඉතා උස ශරීරයක් සහිත , ඉතා දික් දළ ඇති, දිගින්ද දික්වූ පුළුලින්ද පුළුල්වූ මහත්වූ ඇත්පියවර ඇති, උච්චා කණේරුකා නම්වූ ඇතින්නියන් වෙසෙසක් වසන්නා වෙත් , මේ විශාල පිය සටහන එම උච්චා කණේරුකා නම්වූ ඇතින්නියකගේ විය හැක,

මෙසේ සිතා ඔහු තවත් පරීක්‍ෂාකරන්නේ , දිගින්ද දික්වූ පුළුලින්ද පුළුල්වූ මහත්වූ ඇත්පියවරක් සමගම උසැති වෘක්‍ෂයන්හි කඳේ උසින් සීරීම් ලකුනුද දකී, ඇත් දළෙන් ඇන වෘක්‍ෂයන්හි කඳේ ඉතා ඇතිවුනු සටහන් ද දකියි , උසැති වෘක්‍ෂයන්හි උස් අතු රිකිලි කඩා බිඳ ඇතිතැන් දකී, එවන් එලිමහනේ ඇවිදිමින් ඉන්නාවූ, එක්තැනෙක සිටගන සිටින්නාවූ, නොහොත් සැතප සිටින්නාවූ, මහා හස්ති රාජයා දකියි, එම දිගින්ද දික්වූ පුළුලින්ද පුළුල්වූ මහත්වූ ඇත්පියවර මෙම මහා හස්ති රාජයාගේ යැයි ඔහු තීරණයකට පැමිණෙයි.

9‘පින්වත් බ්‍රාහ්මනය, එලෙසමය මේ ලෝකයේ තථාගතයන් වහන්සේ කෙනෙකුගේ පහළවීම. අරහත් සම්මා සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ දෙවියන් මරුන් බඹුන් සහිත, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත, මේ ලෝකයේ සද්ධර්මය දේශනා කරත්, එම ධර්මය මුල මැද අග එක සේම යහපත් වේ , ක්ලේශ ප්‍රහානය කොට ආර්‍ය සත්‍යාවබෝධයෙන් නිර්වාන ප්‍රාප්තියට මාර්ගය දේශනා කරත්

ගෘහස්ත ජීවිතයක් ගෙවන, ඇතැම් කුල පුත්‍රයෙක් , තථාගතයන් වහන්සේ දේශනා කරන එම ධර්මය අසන්නේ, එම ධර්මයේ පැහැද තථාගතයන් වහන්සේ කෙරෙහි අචල ශ්‍රද්ධාව උපදවත්' , මෙසේද සිතත් "ගිහි ජීවිතය ඉතා කම්කටොළු සහිත වන්නේ වෙයි ධූලිපිරි දුර්ග මාර්ගයක් වැන්න, ශ්‍රමණ, බ්‍රහ්මචාරි ජීවිතය ආකාශය මෙන් නිදහස්ය, ගෘහස්තව හිඳ සුපිරිසිදුවූ නික්ලේශීවූ ,ආර්‍යමාර්ගයට පිවිසීම ඉතා දුෂ්කරය, බ්‍රහ්මචාරි ජීවිතයක් සඳහා මම කෙස් රැවුල් බා, කසාවත් දරා, ශ්‍රමණ ප්‍රවජ්‍යාවෙන් ශාසනයට ඇතුල්වීනම් යෙහෙකි"

**10 සීල සංවරය**

'මෙසේ සිතන එම කුලපුත්‍ර තෙමේ, ස්වල්පවූදවේවයි, මහත්වූද වේවයි සියළු ධන සම්පත් හැරලයි, අල්පවූද බොහෝවූද බන්ධුවර්ගයා හැරලයි, කෙස් රැවුල් බා. කසාවත් පොරවා. ගිහි ජීවිතය අත්හැර, ශාසනයෙහි පැවිදි වෙයි, මෙසේ උතුම් ශ්‍රමණ භාවය ලබන්නේ, පර පණ නොනසයි, අනුන්ලවා නොනස්සවයි, දඬු මුගුරු පසෙක ලයි, අවි ආයුධ පසෙකලයි , සියළු සත්ව ප්‍රජාව කෙරෙහි දයාවන්ත වේ, කරුනාවන්තවේ

'අන්සතු දෑ කෙරෙහි ආශාව අත්හරී, නොදුන් දේ ගැනීමෙන් වලකී, ලබන දෙයකින් සතුටු වේ, පිරිසිදු ,නොකිලිටි සිතින් යුක්ත වන්නේ වෙයි, මෙය ද සිය සීලය ලෙස තකන්නේ වෙයි,

මෛථුනයෙන් වළකින්නේ, බ්‍රහ්මචාරී වෙයි ,ලාමකවූ, ග්‍රාම්‍යවූ, කාමසේවනයේ ආදීනව දක්නේ වෙයි , බ්‍රහ්මචාරීබව ද සිය සීලය ලෙස තකන්නේ වෙයි ,මෙය ද සිය සීලය ලෙස තකන්නේ වෙයි,

බොරුකීමෙන් වලකින්නේ, සත්‍යවාදී වේ, සත්‍යය මත පිහිටයි, දැඩිව පිහිටයි, අන්‍යයන් මුලා නොකරන්නේ වෙයි, මෙය ද සිය සීලය ලෙස තකන්නේ වෙයි,

කේලාම් කීමෙන් වලකින්නෙ, අනුන් බිඳුවන එකිනෙකා කෙරෙහි භේධ කරවන වචනයෙන් වලකියි , තමන් තැනකදී ඇසූ දෙයක් කීමෙන් ,වෙනත් තැනක මිතිසුන් නොමනාප වන්නේද ,එබඳු දෑ කීමෙන් වළකියි, අසමගිවූවන් සමගි කරවයි, සමගිවූවන්ගේ සමගිය වඩාලයි, සමගියේ බැඳේ , සමගියේ ප්‍රියවේ, සමගියේ මනාප වේ, සමගිය වැඩෙන වචනම කථාකරයි, මෙය ද සිය සීලය ලෙස තකන්නේ වෙයි,

පරුෂ වචනයෙන් වලකින්නේ, අනුනගේ සිත් අසතුටට පත්වන, දළ භාශිතයෙන් වලකින්නේ වෙයි, අසන්නනගේ යහපතට හේතුවන, අසන්නන්ට ප්‍රියවන, මිහිරි වන, අසන්නන්ගේ හද පිනන, දෑ තෙපුලන්නේ වෙයි, මෙය ද සිය සීලය ලෙස තකන්නේ වෙයි,

හිස් වචනයෙන් (සම්ප්‍රප්පලාපයෙන්) වලකින්නේ, අප්‍රයෝජනවත් හිස් සල්ලාපයේ නොයෙදේ, ගැලපෙන, ප්‍රයෝජනවත්වන, නිබඳ යහපතම සලසන, දේ පමනක් කථා කරයි, ධර්මය සහ විනයට අඩංග දේ ගැන කථා කරයි, මෙය ද සිය සීලය ලෙස තකන්නේ වෙයි,

ගස් හා ලිය සිඳලීමෙන් වලකී,

"එක් වේලකින් පමනක් යැපේ [2] හිරු අවරට ගියපසු අනුභවයෙන් වළකී,

නර්තනයෙන්, ගායනයෙන්, වාදනයෙන්, වළකී, නාටක, විනෝද ජවනිකා, කෙලි සෙල්ලම්, නරඹන්නට යාමෙන් වෙන්වේ,

මල් පැළඳීම, මල්මාලා පැළඳීමෙන්ද, සුවඳ විලවුන් ගැල්වීමෙන්ද සිරුර සරසන නොයෙක් දෙයින්ද වළකී,

උස්වූද, විශාලවූද, සුඛෝපභෝගීවූද, ආසන පරිහරනයෙන් වළකී,

'රත්‍රන් ,හා මිල මුදල් පිලිගැනීමෙන්ද, පරිහරනයෙන්ද වළකී,

නොපිසූ සහල්ද, ධාන්‍යද, අමු (නොපිසූ) මාංශද, පිලිගැනීමෙන් වළකී, කන්‍යාවියන් ,කාන්තාවන් , පිලිගැනීමෙන් වළකී, පිරිමි සහ ස්ත්‍රී දැසි දස්සන් පිලිගැනීමෙන් වළකී, එළුවන්, බැටළුවන් , කුකුලන්, ඌරන්, අලි ඇතුන්, ගවයන්, අශ්වයන්, වෙළඹුන් පිලිගැනීමෙන් වළකී, ගම් බිම්, වතුපිටි පිලිගැනීමෙන් වළකී,

ගිහියන්ගේ පණිවුඩ ගෙනයාමෙන් වලකී, වෙළඳ ව්‍යාපාරවල නොයෙදේ, වැරදි තරාදි පඩි, වැරදි මිම්, යොදමින් කරන, කරවන ව්‍යාපාරවලින් වළකී, අත්ලස් දීමෙන්, සහ ගැනීමෙන් වළකියි, වංචා, කෛයිරාට්කම්වලින් වළකියි,

ශාරීරික හිරිහැර කිරීම් සිරකර තබාගැනීම්වලින් මංපැහැරීම්වලින් සහ කිසියම්ම අපරාධ කටයුතුවේද ඒ සියල්ලෙන් වළකී

'කයවසා ගන්නට එක් දෙපට සිවුරකින් ද, කුසගිනි නිවා ගන්නට සිගා ලබන එක් අහරකින්ද, සතුටට පත්වේ, පියාපත් යුවල පමනක් උසුලාගෙන, මනාප තැනෙකට නිදහසේ පියහඹන පක්ෂියෙකුසේ, එක් සිවුරු යුවලක් හා පාත්‍රය පමනක් දරා නිදහසේ හැසිරෙයි,

'මෙවන් උතුම් සීලයන්ගෙන් පරිපූර්ණවූ, එම භික්ෂුව සිය නිකෙලෙස් පැවැත්ම නිසාම උතුම් සුවයක් ප්‍රීතියක් ලබයි"

**11 ඉන්ද්‍රිය සංවරය**

'ඇසින් රූපයක් දකින්නේ එහි අරමුනු ලෝභ නොහොත් ද්වේශ ලෙස නොගනී ඇසෙන ශබ්ද නිසා ලෝභ නොහොත් ද්වේශ ඇතිකර නොගයි නාසයෙන් ගඳ සුවඳ විඳිද්දී ආසාව හෝ පිලිකුල ඇතිකර නොගයි දිවෙන් රසයක් විඳින්නේ රසය කෙරෙහි ලෝභ නොහොත් ද්වේශ ඇතිකර නොගයි කයෙන් පහසක් විඳින්නේ එම පහස කෙරෙහි ලෝභය නොහොත් ද්වේශය ඇතිකර නොගයි' මනා ඉන්ද්‍රිය සංවරයෙන්ද උසස් සති සම්පජන්නයෙන්ද සමන්විතවූයේ කිසියම්ම අරමුනකින් මනස කිලිට්කර නොගන්නේය මෙම නිකෙලෙස් පැවැත්මම එම භික්ෂුවගේ සුවයට ප්‍රීතියට හේතුවන්නේය

[2] "ලාංකික සංඝයා හීල් දානය සහ දවල් දානය යයි දෙවරක් ආහාර ගනිතත් බුරුමය සියමය වැනි ආසියාතික රටවල භික්ෂූන්ගෙන් වැඩිදෙනෙක්ද යුරෝපීය ඕස්ට්රේලියානු රටවලින් සාසනගතවූ ථෙරවාද භික්ෂූන්ද තථාගතයන් වහන්සේ පණවා වදාල එක් වරක් පමනක් වැළඳීමේ විනය නීතිය නොකඩා රකිති

'ඉදිරියට ගමන්කිරීමේදී ඔහු මනා සිහියෙන් ඉදිරියට ගමන්කරයි ආපසු ඒමේදී ඔහු මනා සිහියෙන් ආපසු ගමන්කරයි ඉදිරිය බලද්දී අවට බලද්දී ඔහු මනා සිහියෙන් බලයි නැමෙද්දී අත් පාදිග කරත්දී අඳන චීවර පාත්‍රය පරිහරනය කරත්දී මනා සිහියෙන් ඒවා පරිහරනයකරයි වැළඳීමේදී පානයකිරීමේදී ආහාරය විකද්දී ආහාරය රස බලද්දී මනා සිහියෙන් ඒවා කරයි කැසිකිලි වැසිකිලි කාර්යයන් ද මනා සිහියෙන් කරයි ඇවිදිද්දී සිටගන සිටිද්දී වාඩිවී සිටිද්දී මනා සිහියෙන් එම ඉරියව් පවත්වයි නින්දට යාමේදී නින්දෙන් පිබිදීමේදී කථා කරත්දී නිහඬවද්දී මනා සිහියෙන් එසේ කරයි

## 12 නීවරණ ප්‍රහානය

උතුම් සීල ප්‍රතිපදාවෙන් යුක්තවූයේ උතුම් ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූයේ උතුම් සති සම්පජන්නයෙන් යුක්තවූයේ එම භික්ෂුව හුදෙකලාව අගයයි වෘක්ෂ මූලයක කඳු බෑවුමක වනයේ ගුහාවක ජන ශූන්‍යය එලිමහනක පාළු සොහොන්බිමක නිදහස් අවකාශයක් සොයා යයි ආහාරයෙන් පසු තෝරාගත් බිම පර්යන්කයෙන් හිඳී කය ඍජුව පිහිටුවාගන්නේ සිහිය පවත්වාගනී

'ලෝකය කෙරෙහි වූ කැමැත්ත ආශාව දුරුකරන්නේ නිරාශාව වඩයි තම සන්තානය ආශාවෙන් හිස්කරයි නොමනාපය තරහව දුරුකරන්නේ සමස්ත ලෝක ප්‍රජාව කෙරෙහිම අනුකම්පා සහගත වේ මෛත්‍රී සහගත වේ තම සන්තානය ද්වේශයෙන් හිස්කරයි අළසබව උකටලීබව දුරුකරන්නේ සතියෙන්ද වීර්යයෙන්ද සන්තානයේ ථීනමිද්ධ අඳුර දුරලා ඥානාලෝකය උපදවාගනී නොසන්සුන් මනස සන්සුන් කරන්නේ උද්ධච්ච කුක්කුච්චය දුරලයි චිත්ත ව්‍යාකුලත්වයෙන් තොරව පැවැතෙයි කුසල් අකුසල් හඳුනාගැන්මේදී කිසිදු සැකයකින් තොරවෙයි විචිකිච්චා නීවරණයද මෙසේ දුරලන්නේ පිවිතුරු මනසින් පැවතෙයි

## 13 චතුර්විධ ධ්‍යාන

මෙසේ නීවරණ ධර්මයෝ පසම ප්‍රහීනකරන්නේ ප්‍රඥාව වැඩුම අඩාලකරන උපක්ලේශ දුරුකරයි මෙසේ කාමයන්ගෙන් මිදුනේ ක්ලේශයන්ගෙන් මිදුනේ එම භික්ෂුව විතක්ක විචාර සහිතවූද, ප්‍රීතිය හා සැපය ඇති පළවෙනි ධ්‍යානයට පිවිස එහි වසයි

පින්වත් බ්‍රාහ්මණය, මෙය තථාගතයන් වහන්සේ ගේ පියවර සටහන වෙයි මෙය තථාගතයන් වහන්සේ පිට අතුල්ලපු තැන වේය. මෙය තථාගතයන් වහන්සේ සිහි නුවණ නැමැති දළින් අත බිඳිනු තැන වේය. නමුත් පින්වත් බ්‍රාහ්මණය, ආර්‍ය ශ්‍රාවක තෙමේ මෙපමනකින්ම භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය ( දතයුතු සියල්ල ස්වකීය ඥානයෙන්ම අවබෝධ කරගත්තේය) භාග්‍යවතුන් වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය ස්වාක්කාතය (මනාකොට දේශනාකරන ලද්දේය) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ආර්‍ය මාර්ගය යන්නෝයැ යි තීරණයට නොපැමිනෙයි

පින්වත් බ්‍රාහ්මණය, මේ භික්ෂුව විතර්ක හා විචාර සංසිඳුවාගෙන තම සිත තුළ ප්‍රසන්න බව ඇති කරගන්නේ , සිතේ ඒකාග්‍රතාවය ලබන්නේ විතර්ක හා විචාර යන්ගෙන් තොර සමාධියෙන් උපන්නාවූ සතියෙන් ඇඩිවූ ප්‍රීතියෙන් අනූනවූ දෙවෙනි ධ්‍යානයට පිලිපන්නෝ වෙයි.

පින්වත් බ්‍රාහ්මණය, මෙය තථාගතයන් වහන්සේ ගේ පියවර සටහන වෙයි මෙය තථාගතයන් වහන්සේ පිට අතුල්ලපු තැන වේය. මෙය තථාගතයන් වහන්සේ සිහි නුවණ නැමැති දළින් අතු බිඳිනු තැන වේය. නමුත් පින්වත් බ්‍රාහ්මණය, ආර්‍ය ශ්‍රාවක තෙමේ මෙපමනකින්ම භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය ( දතයුතු සියල්ල ස්වකීය ඥානයෙන්ම අවබෝධ කරගත්තේය) භාග්‍යවතුන් වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය ස්වාක්කාතය (මනාකොට දේශනාකරන ලද්දේය) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ආර්‍ය මාර්ගය යන්නෝයැ යි තීරණයට නොපැමිනෙයි

පින්වත් බ්‍රාහ්මණය, හටගත් ප්‍රීතියේ ක්ෂයවීමත් සමග සත සම්පජන්නයෙන් සිහියෙන් උපේක්ෂාව වඩන්නේ සුවයෙන් කය පොලායනු දකියි එසේ එම භික්ෂුව තෘතිය ධ්‍යානයට එළඹ එහි වසයි

පින්වත් බ්‍රාහ්මණය, මෙය තථාගතයන් වහන්සේ ගේ පියවර සටහන වෙයි මෙය තථාගතයන් වහන්සේ පිට අතුල්ලපු තැන වේය. මෙය තථාගතයන් වහන්සේ සිහි නුවණ නැමැති දළින් අතු බිඳිනු තැන වේය. නමුත් පින්වත් බ්‍රාහ්මණය, ආර්‍ය ශ්‍රාවක තෙමේ මෙපමනකින්ම භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය ( දතයුතු සියල්ල ස්වකීය ඥානයෙන්ම අවබෝධ කරගත්තේය) භාග්‍යවතුන් වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය ස්වාක්කාතය (මනාකොට දේශනාකරන ලද්දේය) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ආර්‍ය මාර්ගය යන්නෝයැ යි තීරණයට නොපැමිනෙයි

සුඛ වේදනාවන්ගේ හා දුක්ඛ වේදනාවන්ගේ නිරෝධ ය මගම එම භික්ෂුව සතරවන ධ්‍යානයට පිලිපන්නේ වෙයි නොකැලැල් උපේක්ෂාවෙන් හා සතියෙන් සපිරුනේ සැප දුක් දෙකින්ම තොරව වසයි

පින්වත් බ්‍රාහ්මණය, මෙය තථාගතයන් වහන්සේ ගේ පියවර සටහන වෙයි මෙය තථාගතයන් වහන්සේ පිට අතුල්ලපු තැන වේය. මෙය තථාගතයන් වහන්සේ සිහි නුවණ නැමැති දළින් අතු බිඳිනු තැන වේය. පින්වත් බ්‍රාහ්මණය, ආර්‍ය ශ්‍රාවක තෙමේ එවිටද භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය ( දතයුතු සියල්ල ස්වකීය ඥානයෙන්ම අවබෝධ කරගත්තේය) භාග්‍යවතුන් වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය ස්වාක්කාතය (මනාකොට දේශනාකරන ලද්දේය) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ආර්‍ය මාර්ගය යන්නෝයැ යි තීරණයට නොපැමිනෙයි

**14 ත්‍රිවිධ්‍යා**

'එසේ සමාධිගත වූ ඒකාග්‍රවූ සිත සුපිරිසිදුවූයේ ප්‍රභාශ්වරවූයේ නොකැලැල්වූයේ නම්‍යයවූයේ අකම්පිතවූයේ එම භික්ෂුව පූර්ව ජාති ස්මරණය සඳහා සිත මෙහෙයවයි අනේකවූද අප්‍රමානවූද සිය කඳ පිලිවෙල ඔහු දකියි පෙර භවයද පෙර භව දෙකක්ද පෙර භව තුනක්ද පෙර භව හතරක්ද පෙර භව පහක්ද පෙර භව දහයක්ද පෙර භව විස්සක්ද පෙර භව තිහක්ද පෙර භව හතලිහක්ද පෙර භව පණහක්ද පෙර භව සියයක්ද පෙර භව දහසක්ද පෙර භව ලක්ෂයක්ද කල්ප අනන්තයක දී තමා ගතකල ජීවිත දකී එකල මා මෙනම් විය මෙබඳු කුල ගොත්හි වීමි මෙබඳු රුවක් වීමි මෙබඳු ආහාර ගත්තේ වෙමි මෙබඳු සැප දුක් වින්දෙමි මෙලෙස මගේ එම ජීවිතය කෙලවරවිය එම භවයෙන් නික්මුනේ මම මෙබඳු භවයක උපන්නේ වෙමි එකල මා මේ නම් විය මෙබඳු කුල ගොත්හි වීමි මෙබඳු රුවක් වීමි මෙබඳු ආහාර ගත්තේ වෙමි මෙබඳු සැප

දුක් වින්දෙමි මෙලෙස මගේ එම ජිවිතය කෙලවරවිය  එම භවයෙන් නික්මුනේ මම මෙබඳු භවයක උපන්නේ වෙමි එකල මා මෙනම් විය මෙබඳු කුල ගොත්හි වීමි මෙබඳු රුවක් වීමි මෙබඳු ආහාර ගත්තේ වෙමි මෙබඳු සැප දුක් වින්දෙමි මෙලෙස මගේ එම ජිවිතය කෙලවරවිය  එම භවයෙන් නික්මුනේ මම මෙබඳු භවයක උපන්නේ වෙමි මෙසේ ඔහු අනේක අප්‍රමාන පෙර භවයන් සවිස්තරව දකි

15 පින්වත් බ්‍රාහ්මණය, මෙය තථාගතයන් වහන්සේ ගේ පියවර සටහන වෙයි මෙය තථාගතයන් වහන්සේ පිට අතුල්ලපු තැන වේය. මෙය තථාගතයන් වහන්සේ සිහි නුවණ නැමැති දලින් අතු බිඳිනු තැන වේය.  පින්වත් බ්‍රාහ්මණය, ආර්‍ය ශ්‍රාවක තෙමේ එවිටද භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය ( දතයුතු සියල්ල ස්වකීය ඥානයෙන්ම අවබෝධ කරගත්තේය) භාග්‍යවතුන් වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය ස්වාක්කාතය (මනාකොට දේශනාකරන ලද්දේය) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ආර්‍ය මාර්ගය යන්නෝයැ යි තීරණයට නොපැමිනෙයි

'සමාධිගත වූ ඒකාග්‍රවූ සිත සුපිරිසිදුවූයේ ප්‍රභාශ්වරවූයේ නොකැලැල්වූයේ නම්‍යයවූයේ අකම්පිතවූයේ එම භික්ෂුව සත්‍වයන් මැරෙන සැටි සහ නැවත නැවත උපදින ආකාරය දකින්නට සිත මෙහෙයවයි සාමාන්‍ය ඇසින් දැක්ක නොහැකි දිව ඇසින්ම පමනක් දැක්ක හැකි නුවනෙන් අනන්ත සත්‍වයන් උපදිනා සැටිද මියෙන චුතවෙන සැටිද දකියි උසස් පහත් ලක්‍ෂන අවලක්‍ෂන ධනවත් දිළිඳු වාසනාවන්ත අවාසනාවන්ත ජිවිත කර්මානුරූපව ලබන සැටි දකී

'කය වචනය  සිත යන තුන් දොරින් අකුසල් කර ආර්‍යයන්වහන්සේලාට අපහාසකර  සත්‍වයන් ශරීරයාගේ බිඳියාමෙන් පසු මරණින් පසු දුර්ගතීන්හි අපායන්හි ප්‍රේත යෝනීන්හි තිරිසන් භවවල ඉපිද අනේක දුක් පීඩා වධ වේදනා විඳිනසැටි දකී

'නිකෙලෙස් දිවියක් ගෙවූ තුන්දොර සංවරව ජිවත්වූ ආර්‍යයන් වහන්සේලාට නිගරු නොකල නිදොස් දැක්මෙන් යුක්තව ජිවත්වූ සුචරිතයේ හැසිරෙමින් ජිවත්වූ සත්‍වයන් ශරීරයාගේ බිඳියාමෙන් පසු මරණින් පසු සුගතීන්හි දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යය ලෝකවල ඉපිද කර්මානුරූපව සැප විඳින සැටින් දකී සාමාන්‍ය ඇසින් දැක්ක නොහැකි දිව ඇසින්ම පමනක් දැක්ක හැකි නුවනෙන් අනන්ත සත්‍වයන් මෙසේ උපදිනා සැටිද මියෙන චුතවෙන සැටිද කර්මානුරූපව දුක් හා සැප විඳින සැටින් දකී

පින්වත් බ්‍රාහ්මණය, මෙය තථාගතයන් වහන්සේ ගේ පියවර සටහන වෙයි මෙය තථාගතයන් වහන්සේ පිට අතුල්ලපු තැන වේය. මෙය තථාගතයන් වහන්සේ සිහි නුවණ නැමැති දලින් අතු බිඳිනු තැන වේය.  පින්වත් බ්‍රාහ්මණය, ආර්‍ය ශ්‍රාවක තෙමේ එවිටද භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය ( දතයුතු සියල්ල ස්වකීය ඥානයෙන්ම අවබෝධ කරගත්තේය) භාග්‍යවතුන් වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය ස්වාක්කාතය (මනාකොට දේශනාකරන ලද්දේය) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ආර්‍ය මාර්ගය යන්නෝයැ යි තීරණයට නොපැමිනෙයි

'සමාධිගත වූ ඒකාග්‍රවූ සිත සුපිරිසිදුවූයේ ප්‍රභාශ්වරවූයේ නොකැලැල්වූයේ නම්‍යයවූයේ අකම්පිතවූයේ එම භික්ෂුව ආශ්‍රව ධර්මයන්ගේ ඇතිවීම පැවතීම සහ ක්‍ෂයවීම දැකීමට සිත

මෙහෙයවයි ආශ්‍රව ධර්මයන්ගේ හට ගැන්ම මේය ආශ්‍රව ධර්මයන්ගේ නිරෝධය මේය හේ අවබෝධ කරයි ආශ්‍රව ධර්මයන්ගේ නිරෝධයට මාර්ගය මේයැයි හේ අවබෝධ කරයි දුක මේයැයි දුකෙහි හට ගැන්ම මේය දුකෙහි නිරෝධය මේය හේ අවබෝධ කරයි දුක්ඛ නිරෝධයට මාර්ගය මේයැයි හේ අවබෝධ කරයි

පින්වත් බ්‍රාහ්මණය, මෙය තථාගතයන් වහන්සේ ගේ පියවර සටහන වෙයි මෙය තථාගතයන් වහන්සේ පිට අතුල්ලපු තැන වේය. මෙය තථාගතයන් වහන්සේ සිහි නුවණ නැමැති දළින් අත බිඳිනු තැන වේය. පින්වත් බ්‍රාහ්මණය, ආර්‍ය ශ්‍රාවක තෙමේ එවිටද භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය ( දතයුතු සියල්ල ස්වකීය ඥානයෙන්ම අවබෝධ කරගත්තේය) භාග්‍යවතුන් වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය ස්වාක්කාතය (මනාකොට දේශනාකරන ලද්දේය) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ආර්‍ය මාර්ගය යන්නෝයැ යි නිරණයට නොපැමිනෙයි

මෙසේ තත්‍වාවබෝධයෙන් කාම ආශ්‍රවයන්ගෙන් වෙන්වුනාවූද භව ආශ්‍රවයන්ගෙන් මිදුනාවූද අවිජ්ජා ආශ්‍රවයන්ගෙන් නිදහස්වුනාවූද එම භික්ෂුව ජාතිය නිරුද්ධ කලබව අවබෝධ කරයි ඒ උතුම්වූ මාර්‍ගබ්‍රහ්මචරියාව කෙළවරකොට ඇති අර්හත්ඵලය මේ ආත්මයෙහි තමාම දැක ඊට පැමිණ වාසයකළේය. උත්පත්තිය කෙළවර විය. මාර්‍ගබ්‍රහ්මචරියාව වැස නිමවනලදී. සතර මාර්‍ගයෙන් කටයුතු දැ කරන ලදී. මේ ආත්මය පිණිස කළයුතු අනිකක් නැත්තේයයි දැනගත්තේය. ශ්‍රමණ අභ්‍යාසයේ ඵලය ලබාගත්බව අවබෝධ කරයි කළයුතු තවත් කිසිවක් නැත්තේයැයි අවබෝධ කරයි

පින්වත් බ්‍රාහ්මණය, මෙය තථාගතයන් වහන්සේ ගේ පියවර සටහන වෙයි මෙය තථාගතයන් වහන්සේ පිට අතුල්ලපු තැන වේය. මෙය තථාගතයන් වහන්සේ සිහි නුවණ නැමැති දළින් අත බිඳිනු තැන වේය.

පින්වත් බ්‍රාහ්මණය, එවිට පමනක් භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය ( දතයුතු සියල්ල ස්වකීය ඥානයෙන්ම අවබෝධ කරගත්තේය) භාග්‍යවතුන් වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය ස්වාක්කාතය (මනාකොට දේශනාකරන ලද්දේය) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ආර්‍ය මාර්ගය යන්නෝයැ යි ආර්‍ය ශ්‍රාවක තෙමේ නිරණයට පැමිනෙයි

පින්වත් බ්‍රාහ්මණය ඇත් පියවර සටහන පිළිබඳ උපමාව එසේ දතයුතු වේය

භාග්‍යවතුන් වහන්සේ එසේ වදාලවිට ජානුස්සොනි බ්‍රාහ්මණ තෙමේ මෙය කීය

“භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරුකොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේද, වසා තබන ලද්දක් වැසුම් හරින්නේ හෝ වේද, මංමුලාවූවෙකුට මඟ කියන්නේ හෝ වේද, අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ හෝ වේද, මේපරිද්දෙන්ම භවත් ගෞතමයාණන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරනලදී. මේ අපි භවත් ගෞතමයන් වහන්සේ සරණකොට යමු. ධර්මයද භික්ෂු සංඝයාද (සරණ කොට යමු ). භවත් ගෞතම තෙමේ අප අද පටන් දිවිහිම් කොට සරණ ගියාවූ උපාසකයන්යයි දරන සේක්වා.

චූලහත්ථිපදොපම සූත්‍රය නිමියේය